# ඊනියා ජාතික රාජ්‍යය

සාමාන්‍යයෙන් වියුක්ත චින්තනයෙහි දක්ෂයෝ සමාජයීය විද්‍යාවන් හැදෑරීමට නො පෙළඹෙති. ඔවුහු යම් සමාජයීය හේතු නිසා ජෛවීය විද්‍යාවන් හා කළමණාකරණ පාඨමාලා හැදෑරීමට පෙළඹුණ ද සමාජයීය විද්‍යා හැදෑරීමට රුචියක් නො දක්වති. සාහිත්‍යය හා මානව ශාස්ත්‍ර හැදෑරීම සම්බන්ධයෙන් ද තත්වයේ එතරම් වෙනසක් නැත. මෙයින් කියැවෙන්නේ වියුක්ත චින්තනයෙහි දක්ෂ කිසිවකු කිසි දිනෙක සාහිත්‍යය, මානව ශාස්ත්‍ර, සමාජයීය විද්‍යා ආදී විෂය නොහදාරණ බව නො වෙයි. ඉදහිට එවැන්නකු සිටිය ද සාමාන්‍යය අනෙකක් ම වෙයි.

අසවලා වෛද්‍ය විද්‍යාව හැදෑරීම පසෙක ලා මානව ශාස්ත්‍ර හැදෑරීය වැනි ප්‍රකාශ අපට ඇතැම් විට අසන්නට ලැබෙයි. බොහෝ විට නොකියන නමුදු එයට ප්‍රධාන හේතුව වෛද්‍ය විද්‍යාවට අදාළ වූ වියුක්ත චින්තනයට දක්වන අකමැත්ත ය. බටහිර ගණිතයට හෝ බටහිර සෛද්ධාන්තික භෞතික විද්‍යාවට හෝ අදාළ වියුක්ත චින්තනය එපමණට ම බටහිර වෛද්‍ය විද්‍යාවට අදාළ නො වෙයි. එසේ තිබිය දී ඒ තරමටවත් වියුක්ත චින්තනයට රුචියක් නොමැත්තෝ බටහිර වෛද්‍ය විද්‍යාව අතහැර මානව ශාස්ත්‍ර හදාරති.

එහෙත් මෙහි දී කිවයුතු වැදගත් කරුණක් වෙයි. ලංකාවේ ඇතැමුන්ට බටහිර ගණිතය හෝ බරහිර සෛද්ධාන්තික භෞතික විද්‍යාව හෝ හැදෑරීමට තරම් වියුක්ත චින්තනයක් තිබුණ ද, ඒ ක්ෂෙත්‍රවල නිර්මාණ කිරීමට තරම් අවශ්‍ය වියුක්ත චින්තනයක් ඔවුන්ට නැත. අප කලින් ද සඳහන් කර ඇත්තේ බටහිර දැනුමෙහි සංකල්ප හා ප්‍රවාද නිර්මාණය කිරීමට අපේ රටවල ජනයාට හැකියාවක් නැති බව ය. එයට හේතුව බටහිර කිනම් ක්ෂෙත්‍රයක වුව ද සංකල්ප හා ප්‍රවාද නිර්මාණය කිරීමට අවශ්‍ය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය අපට නොමැති වීම ය. වියුක්ත චින්තනය ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි එක් අංගයක් වෙයි.

බටහිර රටවල ඒ ඒ ක්ෂෙත්‍රයෙහි සංකල්ප හා ප්‍රවාද නිර්මාණය කෙරෙන්නේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පදනම් කරගනිමිනි. එහි දී ඒ ඒ ක්ෂෙත්‍රයට අදාළ ප්‍රමාණයට වියුක්ත චින්තනය උපයෝගී කර ගැනෙයි. බටහිර සමාජයීය විද්‍යාවන්හි ද වියුක්ත චින්තනය උපයෝගී කරගෙන සංකල්ප හා ප්‍රවාද නිර්මාණය කිරීමට උත්සාහ ගැනෙයි. එහෙත් බටහිර සමාජයීය විද්‍යාඥයන් තේරුම් නොගන්නා කරුණ නම් බටහිර සමාජයීය විද්‍යාවන්හි බටහිර භෞතීය විද්‍යාවන්හි ප්‍රමාණයට වියුක්ත සංකල්ප හා ප්‍රවාද නිර්මාණය කිරීමට නොහැකි බව ය.

වියුක්ත සංකල්පයක් බොහෝ විට සාධාරණ (general) සංකල්පයක් වෙයි. වියුක්ත අඹ ගෙඩිය යන්න ඕනෑම අඹ ගෙඩියක් සඳහා වලංගු වෙයි. මෙහි දී ඕනෑම අඹ ගෙඩියක් යන්න යෙදෙන්නේ කිසියම් අඹ ගෙඩියක් සඳහා නොව ගණිතයෙහි මෙන් අඹ ගෙඩියක් සාධාරණ වශයෙන් නියෝජනයකිරීම සඳහා ය. බටහිර ගණිතයෙහි ඕනෑම ත්‍රිකෝණයක කෝණ තුනෙහි ඓක්‍යය සෘජු කෝණ දෙකක් යැයි කී විට ඉන් කියැවෙන්නේ යම්කිසි ත්‍රිකෝණයක ගුණයක් නොව සියළු ත්‍රිකෝණවලට පොදු ගුණයකි. අප කලින් ද සඳහන් කර ඇති ආකාරයට ඕනෑම ත්‍රිකෝණයක් යන්න සංයුක්තව ඉන්ද්‍රිය ගෝචර ව ලබාගත හැක්කක් නො වේ. ඒ වියුක්ත සංකල්පයකි.

වියුක්ත මිනිසා යන්න ද එවැනි වූ සාධාරණ සංකල්පයකි. ඒ ඕනෑම මිනිසෙක් වෙයි. ඒ අසවල් මිනිසා නො වෙයි. එහෙත් වියුක්ත සිංහලයා යන්න එලෙස සාධාරණ සංකල්පයක් ලෙස නිර්මාණය කර ගැනීමට බටහිර සමාජයීය විද්‍යා අසමත් වෙයි. එබැවින් සිංහල නමින් ජාතියක් නැතැයි බටහිර සමාජයීය විද්‍යාඥයෝ අපට කියති. බටහිර සමාජයීය විද්‍යාව යම් ප්‍රමාණයකට හැදෑරූ අය මෙන් ම එතරම් නොහැදෑරූ අය ද අර බටහිර සමාජ විද්‍යාඥයන් අනුකරණය කරමින් සිංහල නමින් ජාතියක් නැතැයි බෙරිහන් දෙති.

මේ පඬියන්ට අනුව ජාතිය යන්න මිථ්‍යාවකි. පඬියෝ ජාතිය හා මිථ්‍යාව වැනි මාතෘකා යටතේ සම්මන්ත්‍රණ පවත්වති. තමන්ගේ මතයක් කිසි දිනෙක කියා නැති මොවුහු බටහිරයන්ගේ මත පුනරුච්චාරණය කිරීමෙන් වින්දනයක් ලබති. බටහිරයන්ට තම සමාජයීය විද්‍යාවන්ගේ දුර්වලකම හේතුකොටගෙන ජාතිය යන්නට අර්ථකථනයක් දීමට නොහැකි

© Prof. Nalin De Silva

වුවත් ඔවුන්ට නෛතික ව ජාතිය යන්න නිර්වචනය කිරීමට සිදු වී ඇත. ඔවුන් එහි දී යොදාගන්නා උපක්‍රමය නම් ජාතික රාජ්‍යය යන සංකල්පය ඇසුරෙන් නෛතිකව ජාතියක් නිර්වචනය කිරීම ය.

ජාතික රාජ්‍යය යන්න වියුක්ත සංකල්පයක් නො වෙයි. ජාතික රාජ්‍යය යනු කිසිම වැදගත්කමක් ඇති සංකල්පයක් නො වෙයි. එහි ප්‍රධාන සංකල්පය වනුයේ රාජ්‍යය යන්න ය. යම් නිශ්චිත දේශසීමා සහිත රටක වලංගු නීති සම්පාදනය කිරීමට, ඒ ක්‍රියාත්මක කිරීමට, විධායක කටයුතු කිරීමට, නීති අර්ථකථනය කිරීමට හා රටෙහි පුරවැසියන් කවුදැයි නිශ්චය කර ඔවුන් පාලනය කිරීමට, රට ආරක්ෂාකරගැනීමට, එනම් රටෙහි ස්වෛරීභාවය ආරක්ෂා කරගැනීමට, දේශසීමා නොකැඩී පවත්වාගෙන යෑමට, සහ තවත් එවැනි කරුණු සඳහා පිහිටුවා ගෙන ඇති ආයතනයක් රාජ්‍යය ලෙස හඳුනාගත හැකි ය. එහි ව්‍යවස්ථාදායකයක්, විධායකයක්, අධිකරණයක්, හමුදාවක් ආදී වශයෙන් විවිධ අංග වෙයි.

රාජ්‍යයෙන් රාජ්‍යයට මේ අංග අතර ඇති සම්බන්ධතා වෙනස් වෙයි. ව්‍යවස්ථාදායකය ජනතාව විසින් පත්කෙරෙන්නක් ද නැත් ද ආදී වශයෙන් හා විධායකය ව්‍යවස්ථාදායකයට වගකියන්නේ ද නැත් ද අධිකරණයට කිනම් ස්වාධීනත්වයක් ඇත් ද ආදී වශයෙන් ඒ ඒ අංගවල ගුණ හා ක්‍රියාකාරීත්වයන් වෙනස් විය හැකි ය. එහෙත් රාජ්‍යය යනුවෙන් නෛතික ඒකකයක් හඳුනාගැනීමට බටහිර සමාජීය විද්‍යවන්ට වුව ද හැකි ය. රාජ්‍යය යන්න අවසාන වශයෙන් ගත්කල යම් අවශ්‍යතාවන්ට යටත් වූ භූමි ප්‍රදේශයකින් සමන්විත වෙයි. ඒ භූමිය සන්තතික (ගැවුණ - contiguous) වීම අනිවාර්ය නො වෙයි. ඇමරිකා එක්සත් ජනපදයෙහි ඇලස්කාව එරට අනෙක් ප්‍රදේශවලින් වෙන් වී ඇත. අනිවාර්ය වනුයේ නිශ්චිත භූමි ප්‍රදේශයක් යන්න ය.

පැරණි යුරෝපයෙහි රාජ්‍යවලට මේ නිශ්චිත භූමි ප්‍රදේශය යන සංකල්පය පවා නොතිබුණි. එකල රජවරු තම දියණියන් විවාහ වන අවස්ථාවල දී ඇතැම් විට භූමියෙන් කොටසක් දෑවැද්ද ලෙස දුන්හ. ඉන්පසු ඒ දෑවැද්දට දුන් භූමි ප්‍රදේශය අයත්වූයේ වෙනත් රාජ්‍යයකට ය. එකල ජාතිය යන්න පමණක් නොව රාජ්‍යය යන්න ද අර්ථදැක්වීම බටහිරයන්ට තරමක ප්‍රශ්නයක් විය. රාජ්‍යයෙන් කොටස් දෑවැද්ද සමග දුන් පසු වැසියන්ට ගිය කල දවස ගැන අමුතුවෙන් කිවයුතු නො වෙයි. වැසියෝ අද එක් රාජ්‍යයකට ද හෙට තවත් රාජ්‍යයකට ද අයත්වූහ.

මේ තත්වය වෙනස්කිරීම බටහිරයන් ලැබූ ජයග්‍රහණයක් බවට සැකයක් නැත. අඩුම තරමින් රාජ්‍යයකට නිශ්චිත භූමි ප්‍රදේශයක් ඇතැයි සැලකීම වර්ධනයක් විය. එලෙස රාජ්‍යය අර්ථදැක්වීමෙන් පසුව රාජ්‍යයේ වැසියෝ ජාතිය ලෙස සලකනු ලැබූහ. ජාතිය ද රාජ්‍යය ද එකතුවීමෙන් ජාතික රාජ්‍යය ඇතිවිණි. ජාතික රාජ්‍යය හෝ ජාතිය හෝ යන්න එලෙස ගත්කල ඉතා සංයුක්ත සංකල්ප විය. රාජ්‍යයක එකතුවී සිටි ජනතාව ඒ රාජ්‍යයට අයත් බව පිළිගනු ලැබීම එහි වැදගත් ම අංගය වෙයි. වෙනත් අයුරකින් කිවහොත් ඒ ජනතාව රාජයෙහි රටවැසියන් (පුරවැසියන්) බවට පත්වූහ.

පුරවැසි පණත් මගින් රාජ්‍යවල පුරවැසියෝ කවුදැයි නිර්වචනය කරනු ලැබූහ. එවිට ලෝකයේ අනෙක් වැසියෝ යම් රාජ්‍යයක් සම්බන්ධයෙන් ගත්කල විදේශිකයෝ වූහ. විදේශිකයන්ට ද අවශ්‍ය නම් රාජ්‍යයක පුරවැසියන් වීමේ අවස්ථාව විය. ඒ සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා විය. ඕනෑම අයකුට අවශ්‍ය වූ විටක රාජ්‍යයක පුරවැසියකු වීමට නො හැකි විය.

ඒ කෙසේ වෙතත් එලෙස අර්ථ දැක්වුණු රාජ්‍යය යන්න ඉතා සරල සංයුක්ත සංකල්පයක් විය. අවශ්‍ය වූයේ රාජ්‍යයක් හා රාජ්‍යයේ පුරවැසියන් ය. ඔවුන් සියළු දෙනාම එකම භාෂාවක් කතා කෙළේ ද, එකම සංස්කෘතියකට අයත්වූයේ ද ආදී ප්‍රශ්න වැදගත් නො වී ය. ජාතියේ බහුතරයක් කතාකරන භාෂාවක් බොහෝ විට තිබුණ ද ජාතිය නිර්වචන කිරීම සඳහා එවැනි සාධකයක් අනවශ්‍ය විය. ජාතියේ භාෂාව කුමක් ද ආදී ප්‍රශ්නවලට පිළිතුරු දීමේ හැකියාවක් බටහිර සමාජීය විද්‍යාවන්ට කෙසේ වත් නො වී ය.

සමාජීය විද්‍යාවන්ට පිළිතුරු දිය නොහැකි වුව ද, බොහෝ විට රාජ්‍යයක බහුතරයක් කතාකළ භාෂාවක් ද බහුතරයේ සංස්කෘතියක් ද විය. ඒ භාෂාවන් ජාතියේ භාෂාව වුවා පමණක් නොව ජාතිය හා රාජ්‍යය ද බොහෝ විට ඒ

© Prof. Nalin De Silva

නමින් හඳුන්වනු ලැබී ය. උදාහරණ ලෙස ඉංගිරිසි (English) බස ඉංගිරිසි ජාතියේ බස විය. එංගලන්තය (England) රටේ නම විය. ප්‍රංශ, ජර්මන් ආදී භාෂා හා ජාති සම්බන්ධයෙන් ද තත්වය එසේ ම විය.

මේ තත්වය වෙනස් වූයේ එංගලන්තය විසින් වේල්සය හා ස්කොට්ලන්තය යටත්කරගනු ලැබ බ්‍රිතානිය නම් රාජ්‍යය පිහිටුවනු ලැබීමෙන් පසුව ය. බ්‍රිතානියේ ඉංගිරිසි, වෙල්ෂ් (Welsh), ස්කොට්ෂ් (Scottish) භාෂා කතාකරන ජනයා විසූහ. පසුව ක්‍රමයෙන් ඉංගිරිසි හැරෙන්නට අනෙක් භාෂාවලට තිබූ තත්වය නැතිවුව ද, මුල දී රාජ්‍යයේ භාෂාව කුමක් ද යන ප්‍රශ්නයට පිළිතුරු දීම අපහසු කරුණක් විය. මෙයට පළමු වරදකරුවා ඉංගිරිසි ජාතිය බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. ඔවුන් බ්‍රිතානිය නමින් රාජ්‍යයක් ලෙස හැඳින්වූයේ යටත්විජිත සමගින් වූ රාජ්‍යයකි. වේල්සය හා ස්කොට්ලන්තය එංගලන්තයේ යටත්විජිත විය. ඒ රටවල් යටත්විජිත ලෙස හඳුන්වනවා වෙනුවට ඉංගිරිසිහු ඒ රටවල් ද එකතුකර බ්‍රිතානිය නමින් කෘත්‍රිම රාජ්‍යයක් ඇතිකළහ. එමගින් වේල්සයට හා ස්කොට්ලන්තයට අඩුම තරමින් යටත්විජිත ලෙස පැවතීමේ නිදහස ද අහිමි කරනු ලැබිණි.

ඉංගිරිසිහු පසුව අයර්ලන්තය (Ireland) සම්බන්ධයෙන් ද එවැනි පිළිවෙතක් අනුගමනය කළහ. එරට බ්‍රිතානිය සමග එක්කර ඊනියා එක්සත් රාජධානිය (United Kingdom) ඇතිකිරීම ඉංගිරිසින්ගේ අභිප්‍රාය විය. එයට අවසානයේ දී එකඟ වූයේ අද උතුරු අයර්ලන්තය නමින් හැඳින්වෙන ප්‍රදේශයේ බහුතරය ය. ඒ බහුතරය ආගමින් කතෝලික නොවන ප්‍රොතෙස්තන්ත වීම එයට හේතුව විය. ඒ කෙසේ වෙතත් අද එක්සත් රාජධානිය ලෙස නිල වශයෙන් හැඳින්වෙන රාජ්‍යයේ විවිධ ජනවර්ගවලට අයත් ජනයා වෙති. ඔවුහු සියල්ලෝ ම නොදැනීම මෙන් ඉංගිරිසින් බවට පත්වෙමින් සිටිති. එහෙත් සියල්ලෝම ඒ බවක් නොදන්නාක් මෙන් සිටිති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva